සියලු ම හිමිකම් ඇවිරිණි
All Right Reserved

# කලාප අධ්‍යාපන කාර්යාලය - ගම්පහ

## විකසිත - 2025

(5 ශ්‍රේණිය සිසුන් සඳහා විභව්‍යතාමාන ඇසුරෙන් සැකසූ මාසික ඇගයීම් වැඩසටහන - අංක 5)

**පැය එකයි**

**නම :-**.................................................................. **ශ්‍රේණිය :-** ..............................

### විභාගයට පෙනී සිටින ඔබට උපදෙස්

- ඔබේ විභාග අංකය ඉහත කොටුව තුළ ඇති තිත් ඉර මත ලියන්න.
- තුන්වැනි පිටුවේ ඇති නියමිත ස්ථානයේ ද ඔබේ විභාග අංකය ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 40 ක් ඇත. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම පත්‍රයේ ම සපයන්න.
- සෑම ප්‍රශ්නයකට ම තුන බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක් එක් ප්‍රශ්නයට අදාළ නිවැරදි පිළිතුර තෝරා ඊට යටින් ඉරක් අඳින්න.
- පිළිතුරු ලිවීමට ඇති ප්‍රශ්නවල පිළිතුර තිත් ඉරි මත ලියන්න.
- කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.

### උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි.

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 02 | |
| 03 | |
| 04 | |
| 05 | |
| 06 | |
| 07 | |
| 08 | |
| එකතුව | |
| අවසාන ලකුණු | |
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

| | කෙටි අත්සන හා සංකේතය |
|---|---|
| පළමු පරීක්ෂක | |
| ලකුණුදීමේ පටිපාටිය අනුව උත්තර පත්‍රය ඇගයීම කළ බවට සහතික කරමි. | V/I/S |
| දෙවන පරීක්ෂක | |
| පළමු පරීක්ෂක කර ඇති ඇගයීම නිවැරදි බව සහතික කරමි. | V/I/S |
| ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක | |
| ඇගයීම කර, ප්‍රදානය කළ ලකුණු සහ එකතුව නිවැරදි බව තහවුරු කරමි. | V/I/S |
| ප්‍රධාන පරීක්ෂක | |
| අධීක්ෂණය කළෙමි අවසාන ලකුණු නිවැරදිය. | V/I/S |

කලාප අධ්‍යාපන කාර්යාලය - ගම්පහ


❖ **රූපය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.**

01.




1. පාසලක දර්ශනයකි
2. වෙළඳපොළක දර්ශනයකි
3. අවුරුදු උත්සවයක දර්ශනයකි

02. රූපය සම්බන්ධයෙන් වැරදි ප්‍රකාශය තෝරන්න.




1. මිනිසුන් තොරතුරු ලබාගන්නා ක්‍රමයක් දැක්වෙයි.
2. බොහෝ විට නිවස ආලින්දයේ දැකිය හැකි දර්ශනයකි.
3. රථ වාහන අලුත්වැඩියා කරන ස්ථානයකි.

❖ **පහත A හා B රූප ඇසුරෙන් 03 ප්‍රශ්නයට පිළිතුරු තෝරන්න.**



A



B

03. A රූපයට වඩා B රූපයේ වෙනස්කම,

1. 2ක් දැකිය හැක. 2. 3 ක් දැකිය හැක. 3. 1 ක් දැකිය හැක

විභාග අංකය ................................

❖ **නිවැරදි පිළිතුරු තෝරා යටින් ඉරක් අඳින්න.**


04. එක ළඟ සංඛ්‍යා දෙකක එකතුව 9 කි. එම සංඛ්‍යා දෙක වන්නේ,
1. 5 හා 4  2. 8 හා 1  3. 2 හා 7


05. ළමයි හතර දෙනෙකුගේ දැන් වයස්වල එකතුව අවුරුදු 93 කි. අවුරුදු තුනකට පෙර ඔවුන් හතර දෙනාගේ වයස්වල එකතුව වූයේ අවුරුදු,
1. 81  2. 89  3. 90


06. 2025 වර්ෂයේ අප්‍රේල් 14 දා තෙක් ඇති දින ගණන කීය ද?
1. 103  2. 104  3. 105


07. ළමයෙකුගේ එක අතක ඇඟිලි පහක් ඇත. ළමයි 10 දෙනෙකුගේ අත්වල ඇති මුළු ඇඟිලි ගණන කොපමණ ද?
1. 50  2. 100  3. 200

08. පහත රූප සම්පූර්ණ කිරීමට හිස්තැනට ගැළපෙන කොටස තෝරන්න.




1.


2.


3.

❖ **A හා B නගර අතර දුර 32km කි. සුනිල් A නගරයේ සිට B නගරය දෙසට පැයට 5km ක වේගයෙන් ගමන් කරයි. එම වේලාවේම ගමන් අරඹන විමල් B නගරයේ සිට A නගරය දෙසට පැය 3km ක වේගයෙන් ගමන් අරඹයි.**

09. දෙදෙනා හමුවන්නේ ගමන ආරම්භ වී පැය කීයකට පසු ද?
1. 4  2. 3  3. 5

10. දෙදෙනා හමුවන තැනට B සිට ඇති දුර කීය ද?
1. 25 km  2. 20 km  3. 12 km

❖ **පහත තොරතුරු ඇසුරින් පිළිතුරු ලියන්න.**

අඹ ගෙඩියක් + දොඩම් ගෙඩියක් = 260 g

දොඩම් ගෙඩියක් + ඇපල් ගෙඩියක් = 264 g

අඹ ගෙඩියක් + දොඩම් ගෙඩියක් + ඇපල් ගෙඩියක් = 298 g

11. ඇපල් ගෙඩියක බර,
1. 230 g  2. 234 g  3. 238 g

12. අඹ ගෙඩියක් හා ඇපල් ගෙඩියක බර
1. 268 g  2. 272 g  3. 276 g

ගම්පහ කලාප අධ්‍යාපන කාර්යාලය - ගම්පහ

❖ **නිවැරදි පිළිතුරු තෝරා යටින් ඉරක් අඳින්න.**

13. සියයේ බාගයෙන් බාගයට දහයක් අඩු සංඛ්‍යාව කීය ද?

1. 25  2. 35  3. 15

14. ළමයෙක් පොතක 21 සිට 61 දක්වා පිටු කියවා අවසන් කරන ලදී. ඔහු කිය වූ පිටු අතර 3 ඉලක්කම ලියා ඇති පිටු ගණන කීය ද?

1. 13  2. 14  3. 12

15. පාසලක අධ්‍යාපනික ප්‍රදර්ශනයක් ජුනි 27 වනදා ආරම්භ වී නොකඩවා දින 10 ක් පුරා පැවැත් විණි. ප්‍රදර්ශනය අවසන් වූ දිනය විය හැක්කේ,

1. ජූලි 07  2. ජූලි 06  3. ජූලි 08


16. ඇතුළත නොපෙනෙන පෙට්ටියක නිල් පෑන් 6 ක් ද රතු පෑන් 9 ක් ද කළු පෑන් 10 ක් ද ඇත. පෙට්ටිය දෙස නොබලා **ස්ථිරවම** නිල් පෑනක් ඉවතට ගැනීමට ගත යුතු **අවම** පෑන් ගණන වන්නේ,


1. 19  2. 20  3. 26


17. පහත දැක්වෙන කුඩා ඝනක සියල්ලම භාවිත කොට විශාල ඝනකයක් සෑදිය නොහැකි අවස්ථාව වන්නේ,


1. 27  2. 64  3. 36

18. පහත රූපයේ අඩු කොටස තෝරන්න.




1.


2.


3.

❖ **පහත තොරතුරු නිවැරදිව ගළපා ඇති පිළිතුරු තෝරන්න.**

19. කවිය නිවැරදිව ගළපා ඇති පිළිතුර වන්නේ,

A. කීකරු පොඩි ළමයාගේ  C. කවුරුත් පවසති අගේ

B. තිබෙන රෝස මල වගේ  D. පාට සුවඳ එක වගේ

1. D B A C  2. D B C A  3. B D A C

20. නිවැරදි වාක්‍ය සෑදෙන සේ ගළපා ඇති පිළිතුර තෝරන්න.

A. රටක සංවර්ධනයට  C. එකමුතුකම  E. ඉවහල් වේ.


B. මිනිස් සමාජයේ  D. බෙහෙවින්

1. A B C D E  2. B C A E D  3. E B A C D

21. යෝගට් 4 ක් මිලට ගන්නා විට 1 ක් නොමිලයේ ලැබේ. යෝගට් 22 ක් මිලට ගත් අයෙකුට නොමිලයේ ලැබෙන යෝගට් ගණන කීය ද?

1. 5     2. 6     3. 20

❖ **පහත දැක්වා ඇත්තේ ලණුවක් කොටස් කීපයකට නවා කඩ ඉරි වලින් දක්වා ඇති ස්ථානවලින් කපා ඇති ආකාරයයි.**





22. වඩාත් දිගම කැබැල්ලකට හිමි ඉංග්‍රීසි අකුර විය හැක්කේ,

1. A     2. F     3. C

23. එක සමාන දිගින් යුත් කොටස්වලට හිමි ඉංග්‍රීසි අකුරු වන්නේ,

1. A B C     2. B D E     3. B D F

❖ **පහත තොරතුරු ඇසුරෙන් නිවැරදි පිළිතුර තෝරන්න.**




24. අඳුරු කර ඇති කොටසට ගැළපෙන සංඛ්‍යාව වන්නේ,

1. 16     2. 24     3. 28

25. මෙම රූපයේ කුමන හෝ ස්ථානයකට ඇතුළත් කළ නොහැකි සංඛ්‍යාවක් වන්නේ,

1. 21     2. 11     3. 20

❖ **පහත ප්‍රකාශ ඇසුරින් 26 - 27 ප්‍රශ්නවලට පිළිතුරු තෝරන්න.**

❖ ජානකී සිය 12 වන උපන්දිනය 2023 ජනවාරි 05 වන සිකුරාදා සමරන ලදි.

26. 2024 දෙසැම්බර් 31 වන දා දවස කුමක් ද?

1. සෙනසුරාදා     2. අඟහරුවාදා     3. බදාදා

27. ජානකී සිය 13 වන උපන්දිනය සමරන දවස කුමක් ද?

1. සෙනසුරාදා     2. බදාදා     3. බ්‍රහස්පතින්දා

කලාප අධ්‍යාපන කාර්යාලය - ගම්පහ


❖ **පහත කවිය ඇසුරෙන් 28 - 29 ප්‍රශ්නවලට පිළිතුරු තෝරන්න.**

සරු පොළොවක් අපට ඇතේ - ගතේ සවිය හිතේ ඇතේ
රට දියුණට නැගුමට නම් - වෙහෙස වීම උතුම් උතුම්

28. ශරීරයේ යන්නට සමාන අදහස දෙන පදයක් මෙහි සඳහන් වේ. එය කුමක් ද?
  1. වෙහෙස  2. ඇතේ  3. ගතේ

29. කවියේ සමස්ත අදහසින් කියවෙන්නේ,
  1. රට දියුණු කිරීමට සරු පොළොව අවශ්‍ය බවයි.
  2. රට දියුණු කිරීමට ශක්තිය අවශ්‍ය බවයි.
  3. සරු පොළොව යොදා ගනිමින් වෙහෙස වී වැඩ කර රට දියුණු කළ යුතු බවයි.

❖ **පහත දක්වා ඇති ආකාරයට සෘජුකෝණාස්‍ර හා ත්‍රිකෝණාකාර කඩදාසි කැබලි 2 ක් එක මත එක තබා කඩ ඉරි දිගේ කපා වෙන් කරනු ලැබේ.**



30. ලැබෙන ත්‍රිකෝණාකාර වූ හැඩ ඇති කඩදාසි කැබලි ගණන,
  1. 2  2. 3  3. 4

31. ලැබෙන සෘජුකෝණාස්‍රාකාර කඩදාසි කැබලි ගණන වන්නේ,
  1. 02  2. 04  3. 06

❖ **නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

32. ළමයින් 15 ක් සිටින පෝළිමක සමන් අග සිට 5 වැනියාට සිටියි. ඔහු ඔහුට ඉදිරියෙන් සිටි 5 දෙනෙකු පසු කර ගොස් ඊට ඉදිරියෙන් සිට ගත්තේ ය. දැන් ඔහුට පිටු පසින් සිටින ළමයින් ගණන කීය ද?
  1. 10  2. 9  3. 7



කලාප අධ්‍යාපන කාර්යාලය - ගම්පහ

33. පන්තියක සිටින මුළු ළමයින් ගණන 40 කි. එම පන්තියේ පිරිමි ළමුන්ගේ දෙගුණයෙන් ගැහැනු ළමයි සංඛ්‍යාව අඩු කළ විට පිළිතුර 35 නම් එම පන්තියේ සිටින ගැහැනු ළමයි ගණන කීය ද?

1. 10 2. 15 3. 20

34. හැඩයෙන් වර්ණයෙන් හා පාටින් සෑම අතින් ම සමාන එකම ප්‍රමාණයේ මැටි බෝල 8 ක් ඇත. එහෙත් එම බෝල අතරින් එකක් අනිත් බෝලවලට වඩා බරින් වැඩි ය. එම බෝලය තෝරා ගැනීමට රූපයේ දැක්වෙන ආකාරයේ තරාදියක් කී වරක් අවම වශයෙන්භාවිත කළ යුතු ද?



1. 8 2. 4 3. 3

35. 100 g ක් බර පාන් පිටි බෝලයක් ගත් ළමයෙක් එහි පිටිවල බර ප්‍රමාණය වෙනස් නොවන සේ කුඩා පිටි බෝල පහකට වෙන් කරන ලදි. මෙම කුඩා පිටි බෝල සියල්ලේ බර මුලින් තිබූ පිටි බෝලයේ බරට


1. වඩා වැඩි ය. 2. වඩා අඩු ය. 3. සමාන ය.

❖ **රටාව අනුව හිස්තැනට ගැළපෙන සංඛ්‍යාව තෝරා හිස්තැන් මත ලියන්න.**

36. | 8 | 3 | 4 | , | 7 | 3 | 5 | , | 8 | 4 | 3 | , | 7 | 3 | …. |

1. 5 2. 4 3. 6

37.




1. 60 2. 120 3. 48

කලාප අධ්‍යාපන කාර්යාලය - ගම්පහ

❖ **නිවැරදි පිළිතුරු තෝරා යටින් ඉරක් අඳින්න.**

38. 2024 වර්ෂයේ ජනවාරි 03 වන දා ඉරිදාවකි. එම වර්ෂයට දින 53 බැගින් ඇති දවස් මොනවා ද?

1. සිකුරාදා - සෙනසුරදා
2. ඉරිදා - සඳුදා
3. බ්‍රහස්පතින්දා - සිකුරාදා

39. මුදලකින් $\frac{1}{4}$ ක් රුපියල් 300.00 ක් වේ. එම මුදලින් $\frac{3}{10}$ ක් විය හැක්කේ,

1. රුපියල් 120.00 2. රුපියල් 360.00 3. රුපියල් 600.00

40. වෙළෙන්දෙක් තැඹිලි ගෙඩියක් රුපියල් 70.00 කට විකුණා රුපියල් 10.00 ක් ගෙඩියකින් පාඩු ලබයි. ඔහු තැඹිලි ගෙඩි 5 ක් විකුණා රුපියල් 100.00 ලාභ ලැබීමට තැඹිලි ගෙඩියක් විකිණිය යුතු මුදල කීය ද?

1. රුපියල් 100.00 2. රුපියල් 90.00 3. රුපියල් 120.00

කලාප අධ්‍යාපන කාර්යාලය - ගම්පහ